# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2463/28 – 2025 නොවැම්බර් මස 20 වැනි බ්‍රහස්පතින්දා – 2025.11.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**

විනෝද බද්ද

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතින් ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අයකරනු ලබන ඇතුලත්වීමේ ගාස්තුවෙන් සියයට දහයක (10%) විනෝද බද්දක් පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණ පොතෙහි තීරණ අංක 2024.01.23/59 හි සඳහන් කර ඇති පරිදි දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර එම්. කේ. බන්දුල හරිස්චන්ද්‍ර වන මා විසින් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

**එම්.කේ. බන්දුල හරිස්චන්ද්‍ර,**
ආණ්ඩුකාරවර,
දකුණු පළාත.

2025 ක් වූ ඔක්තෝබර් මස 23 වැනි දින,
ගාල්ල,
දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

1A – PG7362– 06 (2025/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**තීරණය**

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුලත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින් 10% (සියයට දහයක) ට සමාන මුදලක් බද්දක් වශයෙන් පනවා අයකළ යුතු යැයි 2024.01.23 දිනැති තීරණ අංක 59 මගින් මා විසින් තීරණය කරනු ලබන අතර මෙම තීරණය *ගැසට් පත්‍රයේ* පළ කරන ලද මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ පළමු වන දින සිට ක්‍රියාත්මක විය යුතු යැයිද, ඉහත පනවන ලද විනෝද බද්ද එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරුන් විසින් නිසි ලෙස කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා විසින් තීරණය කරන ලදි.

EOG 11 – 0151

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.